# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2165/48 – 2020 මාර්තු 05 වැනි බ්‍රහස්පතින්දා – 2020.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 ජුනි මස 23 වැනි දින අංක 1972/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 117 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන් ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2015/එච්ඩබ්ලිව්/293.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ඩීඑස්බී/එල්එන්ඩී/03/එෆ්අයි/35-XIV.
2020 පෙබරවාරි මස 19 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 348, කහවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කහවත්ත ගමේ පිහිටි අ.ග.පි. 291 හි අතිරේක අංක 32 හා පත්‍ර අංක 23 හි පහත නම හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම් වූ,

**01. කැබලි අංක 963 – අලහෙන්පිට්ටනියෙකොරටුව, අඹගහවත්ත, අලහෙන්පිටිවේන්නේවත්ත, එගොඩහවත්ත, පැලවත්ත සහ තණකොරටුව – ප්‍රමාණය: හෙක්. 0.0023**

උතුරට: කැබලි අංක 117 සහ 796; නැගෙනහිරට: කැබලි අංක 964; දකුණට: කැබලි අංක 158; බටහිරට: කැබලි අංක 158 සහ 117.

03 - 811

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ අංකය: L/03J/91/LRB/91-II.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ යොමු අංකය:
GCF/ATH/NG/08/LR.

අංක 1519/19 හා 2007.10.17 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළවී ඇති ශුද්ධි පත්‍රිකා නිවේදනයෙහි අංක ''1512/3'' යන්න ''1512/5'' ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 04 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 816

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.